ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
**DEPARTMENT OF AGRARIAN DEVELOPMENT**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 7/5/15/5 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.06. 25 |

**චක්‍රලේඛ : 8/2020**

සියලුම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වරුන්,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්,
සියලුම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්.

<u>රජයේ නිලධාරීන් ඇප තබනු ලැබීම</u>

ගොවිජන සේවා මධ්‍යස්ථාන සහ ගොවිජන සේවා සංවර්ධන සභා/ ගොවිජන සේවා කාරක සභා ප්‍රාදේශීය ආයතන ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් සහ ඒවා වාණිජ්‍ය හා මූල්‍ය කටයුතු වල නිරත වන බැවින් ගණුදෙනු සටහන් තැබීම, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ තොග පාලනය යාවත්කාලීනව සිදු වන බවට වග බලා ගත යුතුව ඇත. ඊට අමතරව සංවර්ධන ඒකකයක් ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන ද ගොවීන්ගේ ආයතනයක් ලෙස ගොවිජන සංවර්ධ සභාව/ ගොවිජන සේවා කාරක සභාව ද තම මෙහෙවර හා අරමුණු ඉටු කර ගැනීම සඳහා සංවිධානය වී ඇත.

02. එබැවින් උක්ත අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවිජන සංවර්ධන සභා/ ගොවිජන සේවා කාරක සභා සහ දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු නිරන්තරයෙන් විගණනයට ලක් කිරීම සිදු වේ. මෙම කාර්යයන් ඉටු කිරීමේ දී එහි සෘජු වගකීම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වරුන්, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්, මධ්‍යස්ථාන කළමණාකරන සහකාර වරුන් සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් වෙත පැවරේ.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 880 සහ අභ්‍යන්තර ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 07/2019 හා 2019.03.23 දිනැති ලිපිය කෙරේ ඔබගේ අවධානය යොමු කරමි.

04. විවිධ මූල්‍ය අක්‍රමිකතාවයන් නිසා රජයේ මුදල් අවභාවිත වන බව සහ එම මුදල් රජයට අහිමි වන බැවින් නිලධාරීන් ද අපහසුතාවයට පත් වන බව විගණකාධිපතිවරයා පෙන්වා දී ඇත.යම් නිලධාරියෙකුගෙන් කිසියම් මුදලක් අය වීමට ඇත්නම්, එය පියවා දැමීමේ ක්‍රමයක් ලෙස ඇප තැබීමේ ක්‍රමය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 ජේදයේ පැහැදිලිව සඳහන් කර ඇත.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ.பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, No. 42, SIR MARCUS FERNANDO MAWATHA, P.O. BOX. 537, COLOMBO 07.
දුරකථන/ தொலைபேசி/ Telephones :

| | | | |
|---|---|---|---|
| පොදු කාර්යාලය<br>பொது அலுவலகம்<br>General Office | 011 2694231<br>011 2694232<br>011 2694233<br>011 2694234 | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්<br>கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம்<br>Commissioner General of Agrarian Development | 011 2691060 |
| ෆැක්ස්<br>தொலை நகல்<br>Fax | 011 2693572<br>011 2691843<br>011 2674481 | E - mail : commissionerdad@yahoo.com | විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිසේවා / கொவிசேவா / Agraservis |

ඒ අනුව රජයේ නිලධාරීන් ඇප තැන්පත් කළ යුතු මුදල් සීමාවන් හා ඇප තැන්පත් කළ යුතු ආකාරය පහත පරිදි වේ.

| අනු අංකය | තනතුරු නාමය | සේවය | ඇප තැබිය යුතු ප්‍රමාණය | ඇප මුදල් අය කර ගත යුත ක්‍රමය |
|---|---|---|---|---|
| 01 | නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් | ශ්‍රී ල.ප.සේ. | 15, 000.00 | රු. 5000.00 ක මූලික කොටසකින් හා ඉතිරි මුදල වාරික 4 කින් |
| 02 | ගොවිජන සංවර්ධන නිලධාරී | දෙපාර්තමේන්තුගත | 15, 000.00 | රු. 2, 500.00 ක මූලික කොටසකින් හා ඉතිරි මුදල වාරික 5 කින් |
| 03 | මධ්‍යස්ථාන ලිපිකරු | දෙපාර්තමේන්තුගත | 5, 000.00 | රු. 1,000.00ක මූලික කොටසකින් හා ඉතිරි මුදල වාරික 4 කින් |
| 04 | කෘ.ප.නි.ස. | දෙපාර්තමේන්තුගත | 2, 500.00 | රු.500.00 ක මූලික කොටසකින් හා ඉතිරි මුදල වාරික 4 කින් |

මෙම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසු ඉහත වගුව අනුව අදාළ ඇප මුදල් ලබා ගෙන ඔවුන් එම සේවයේ යෙදවිය යුතු බව දන්වමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. විගණකාධිපති - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
2. ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය - කාරුණික අවධානය සඳහා
3. ප්‍රධාන කාර්යාලයේ කොමසාරිස්වරුන් - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
4. ප්‍රධාන ගණකාධිකාරී - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
6. ප්‍රධාන කාර්යාලයේ සියලුම සහකාර කොමසාරිස්වරුන් - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා